විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சு

MINISTRY OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM

**මාධ්‍ය නිවේදනය**

## ශ්‍රී ලංකාව සහ ඉතාලිය රියදුරු බලපත්‍ර අන්‍යෝන්‍ය වශයෙන් පිළිගැනීම සඳහා වන ද්විපාර්ශ්වික ගිවිසුම අලුත් කරයි

ශ්‍රී ලංකා රජය සහ ඉතාලි රජය විසින්, 2025 දෙසැම්බර් 12 වැනි සිකුරාදා දින, ඉතාලියේ රෝමයේදී, ඉතාලිය සහ ශ්‍රී ලංකාව අතර රියදුරු බලපත්‍ර අන්‍යෝන්‍ය වශයෙන් පිළිගැනීම සඳහා වන ද්විපාර්ශ්වික ගිවිසුම, විධිමත් ලෙස, අලුත් කරන ලදී. ඉතාලියේ ශ්‍රී ලංකා තානාපති සත්‍යා රොද්‍රිගෝ ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ගිවිසුමට අත්සන් තැබූ අතර, ඉතාලියේ විදේශ කටයුතු සහ ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ නියෝජ්‍ය අමාත්‍ය සහ රාජ්‍ය ලේකම් මාරියා ත්‍රිපෝදි ඉතාලි රජය වෙනුවෙන් ගිවිසුමට අත්සන් තැබීය.

2021 වසරේදී මෙම ගිවිසුම කල් ඉකුත් වීමෙන් අනතුරුව එය අලුත් කිරීම සඳහා දෙරටේ මෝටර් රථ ප්‍රවාහන / ගමනාගමන බලධාරීන් අතර සාකච්ඡා ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම මෙම අත්සන් කිරීමේ ක්‍රියාවලිය මඟින් සංකේතවත් වේ. රියදුරු බලපත්‍ර පිළිබඳ ගිවිසුම මගින්, දෙරටෙහි ස්ථිර පදිංචිය ලබා ඇති පුද්ගලයන්ගේ රියදුරු බලපත්‍ර වලංගුභාවයට පත් කර ගැනීමට පහසුකම් සපයයි. මෙම ගිවිසුම ප්‍රථම වරට ශ්‍රී ලංකාව සහ ඉතාලිය අතර 2011දී අත්සන් කරන ලද අතර එය 2021දී කල් ඉකුත් වීමට පෙර නැවතත් 2016 දී අලුත් කර ඇත.

මෙම ගිවිසුම යටතේ, වසර හයක කාලයක් සඳහා අදාළ රටවල පදිංචිව සිටින දෙරටේ ජාතිකයින්ට න්‍යායාත්මක හා ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය වීමෙන් තොරව තම ජාතික රියදුරු බලපත්‍රය අනෙක් රටෙහිදී භාවිතා කිරීමට පහසුකම් සැලසෙයි. මෙය, ඉතාලියේ පදිංචිව සිටින සහ සේවයේ නියුතු අති විශාල ශ්‍රී ලාංකික ප්‍රජාව විසින් බෙහෙවින් අගය කර ඇති අතර, ඵලදායී විදේශගත ප්‍රජාවක් ලෙස ඉතාලිය තුළ ඔවුන්ගේ දායකත්වයට පහසුකම් සලසමින්, රැකියා අපේක්ෂාවන් සහ අනාගත රැකියා අවස්ථා වැඩිදියුණු කිරීමට උපකාරී වී තිබේ.

මෙම ගිවිසුම වසර පහක කාලයක් සඳහා වලංගු වේ. දෙරටේ රජයන් විසින් අපරානුමත කිරීමෙන් අනතුරුව, ගිවිසුම දින 60ක කාල සීමාවක් තුළදී බලාත්මක වනු ඇත. ගිවිසුම බලාත්මක වීමෙන් අනතුරුව දෙපාර්ශ්වයම ඒ සම්බන්ධයෙන් නිවේදනයක් නිකුත් කරනු ඇත.

**විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය**
**කොළඹ**

**2025** දෙසැම්බර් **12** වැනි දින

**Foreign Affairs**
විදේශ කටයුතු
வெளிநாட்டு அலுவல்கள்
**Republic Building, Colombo 1**
ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 1
குடியரசுக் கட்டிடம், கொழும்பு 1
☎ 2 325 373/5, 2 207 200/7
cypher@mfa.gov.lk

**Foreign Employment**
විදේශ රැකියා
வெளிநாட்டு வேலைவாய்ப்பு
**17th Floor, "Mehewara Piyesa", Narahenpita, Colombo 5**
17 වන මහල, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 5
17 ஆவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்டி, கொழும்பு 5
☎ 2 331 200
info@mfe.gov.lk

**Tourism**
සංචාරක
சுற்றுலாத்துறை
**No 03, Times Building, Bristol Street (Sir Razik Fareed Mw), Colombo 1**
අංක 03, ටයිම්ස් ගොඩනැගිල්ල, බ්‍රිස්ටල් වීදිය (සර් රාසික් ෆරීඩ් මාවත), කොළඹ 1
இல.03, டைம்ஸ் கட்டிடம், பிரிஸ்டல் தெரு (சர் ராசிக் ஃபரீத் மாவத்தை), கொழும்பு 1
☎ 2 381 798, 2 321 222
secretary@tourismmin.gov.lk